**මැටි වළං කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2014 තවාළුවිල හා බොරලැස්ස**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික කර්මාන්ත අතුරින් මැටි අශ්‍රිතව වළං නිපදවීමේ කර්මාන්තය සුවිශේෂීව හඳුනාගත හැකිය.බොහෝ කාලයක් මුළුල්ලේ මෙම කර්මාන්තයේ නියැලුණු විශාල පවුල් සංඛ්‍යාවක් කොට්ඨාසය තුල සිටියද මෙම කර්මාන්තය හමුවේ එල්ල වී ඇති තර්ජන නිසාවෙන් දිනෙන් දින විශාල පවුල් ප්‍රමාණයක් ඉවත් වීම දැකිය හැකිය. නවීන තාක්ෂණික දැනුම අඩුකම, උපකරණ ලබා ගැනීමේ අපහසුව, පෝරණු ඉදිකර ගැනීමේ අපහසුව හා ආදේශන භාණ්ඩ වෙළඳපලට පැමිණීම යනාදී කාරණා කර්මාන්තකරුවන් කර්මාන්තයෙන් ඉවත් වීමට හේතු සාධක වුවද තවාළුවිල හා බොරලැස්ස ගම්මානයන් ආශ්‍රිතව පවුල් 20ක් පමණ දැඩි දුෂ්කරතා මැද මෙම කර්මාන්තයේ නියැලී සිටී.

තවාළුවිල හා බොරලැස්ස ගම්මානයන්හි මැටි වළං කර්මාන්තයේ නියැලි කර්මාන්තකරුවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව 2014 වසරේදි ක්‍රියාත්මක කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය එකඟ විය.

මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු ව්‍යාපෘති පිරිවැය රුපියල් 680000.00 කි. විදුලි සකපෝරු සහ උළු ලබාදීම, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්, විදුලි සකපෝරු භාවිතය හා ගෘස් වළං නිෂ්පාදනය පිළිබඳ තාකිෂණික පුහුණු වැඩසටහන් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

## කර්මාන්තකරුවන් නිරීක්ෂණය











## ව්‍යවසායකත්ව හා කළමනාකරණ පුහුණු වැඩසටහන






**ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු ආපදා කළමනාකරණ අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමන්ගේ සුරතින් විදුලි සකපෝරු ප්‍රදානය කිරීම**



**විදුලි සකපෝරු භාවිතය හා ගැස් වළං නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික පුහුණු වැඩමුළුව**

















ගෑස් වලං නිෂ්පාදනයෝ
අපේ රටේ නිෂ්පාදනයකි.